සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** | **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** | **தரம் 07**
**Third Term Test 2017** | **Grade 07**

**බුද්ධ ධර්මය - I කොටස**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පස්වග මහණුන් රහත්භාවයට පත් වූයේ කිනම් සූත්‍රය ඇසීමෙන් ද?
   I. දම්සක් පැවතුම් සූත්‍රය
   II. අනන්ත ලක්ඛන සූත්‍රය
   III. ආදිත්ත පරියාය සූත්‍රය

2. බුදුන්වහන්සේ පූතිගත්තතිස්ස තෙරුන්ට උපස්ථාන කිරීම තුළින් ප්‍රකටව පෙනෙන්නේ,
   I. ගිලානෝපස්ථානයයි.
   II. පුරිසදම්ම සාරථී ගුණයයි.
   III. තාදී ගුණයයි.

3. "සිරිත් මල්දම" නම් කාව්‍ය ග්‍රන්ථය රචනා කරනු ලැබූයේ,
   I. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   II. ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා
   III. අලගියවන්න මුකවෙටි තුමා

4. භාවනා කිරීමේදී බද්ධ පර්යංකයෙන් සිටිය යුත්තේ,
   I. පුරුෂ පාර්ශවය පමණි
   II. කාන්තා පාර්ශවය පමණි
   III. කාන්තා පුරුෂ යන දෙපාර්ශවයටයි

5. "මිගාර මාතා" නමින් ප්‍රසිද්ධ වූයේ,
   I. සුජාතා සිටු දේවියයි
   II. විශාඛා සිටු දේවියයි
   III. සුමනා සිටු දියණියයි

6. ගෘහස්ථ ශීලය යනු,

I. පංචශීලයයි
II. අටශීලයයි
III. දස ශිලයයි

7. සිඟාලෝවාද සූත්‍රයේ එන සදිසා නමස්කාරයේ දී ගුරුවරුන් උපමාකොට ඇත්තේ,

I. උතුරු දිශාවටයි
II. නැගෙනහිර දිශාවටයි.
III. දකුණු දිශාවටයි.

8. චතුරාර්ය සත්‍ය විස්තර කොට ගනිමින් දේශනා කළ සූත්‍රය වන්නේ,

I. කරණීය මෙත්ත සූත්‍රය.
II. දම්සක් පැවතුම් සූත්‍රය.
III. ගිරිමානන්ද සූත්‍රය.

9. අත්තුපනායික ධර්ම පර්යාය ඇතුළත් සූත්‍රය වන්නේ,

I. වේළුද්වාර සූත්‍රය.
II. ගිරිමානන්ද සූත්‍රය.
III. කරණීය මෙත්ත සූත්‍රය.

10. ආර්ය අෂ්ටාංගික මාර්ගය ශික්ෂාවශයෙන් ත්‍රිවිධාකාරය එනම්,

I. පඤ්ඤා, ශීල, සමාධි
II. දාන, ශීල, භාවනා
III. ශ්‍රැත, ත්‍යාග, පඥා

- **11 - 15 දක්වා ප්‍රකාශයන් හරිනම් (✔) ලකුණද වැරදි නම් (X) ලකුණද යොදන්න.**

11. ගිරිමානන්ද සූත්‍රයට අනුව රෝග හට ගන්නා ක්‍රම 08 කි. (..........)
12. කම්ම නියාම යනු කාළගුණික හේතු නිසා පුද්ගල ජීවිතවලට සිදුවන බලපෑමයි . (..........)
13. ඒහි භික්ෂු පැවිද්දෙන් පළමුව පැවිදි වූයේ පස්වග මහණුන්ය. (..........)
14. තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාව විශාඛාවන්ය. (..........)
15. බුදු හිමියන් තමන්ට ගුරුවරයෙකු නැති නිසා ධර්මය ගුරුතන්හි තබා ගත්තේ පස්වන සතියේදීය. (..........)

- **16 - 20 දක්වා වගන්තිවලට සුදුසු පද වරහන් තුළින් තෝරා වගන්ති සම්පූර්ණ කරන්න.**

16. කාව්‍යශේඛරය රචනා කරන ලද්දේ ............................................ හිමියන්ය.

17. දෙව්රම් වෙහෙරෙහි බෝධිය රෝපණය කිරීමට මගපෙන්වීම ලබා දුන්නේ ............................................ හිමියන්ය.

18. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක් දිවට වැඩම කරවූයේ ............................................ පෝය දිනය.

19. පස්වග තවුසන්ට ප්‍රථම ධර්ම දේශනාව පවත්වන ලද්දේ ............................................ පෝය දිනදීය.

20. බුදුරජාණන් වහන්සේ ඇතුළු ප්‍රථම රහත් පිරිස ධර්ම ප්‍රචාරය ආරම්භ කළේ ............................................ පෝය දිනදීය.

(ඉල්, උඳුවප්, ආනන්ද, තොටගමුවේ ශ්‍රී රාහුල, ඇසල)

(ලකුණු 2 x 20 = 40)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** **தரம் 07**
**Third Term Test 2017** **Grade 07**

**බුද්ධ ධර්මය - II කොටස**

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) I. ප්‍රථම සංඝ සන්නිපාතයට සහභාගී වූ භික්ෂූන් වහන්සේලා ගණනින් කීයද?

II. සත් සතිය වන්දනා කරන ගාථාව ලියන්න.

III. බුද්ධත්වය ලැබූ පසු ප්‍රථම වරට කිඹුල්වත්පුරට වැඩම කළේ කිනම් පොහොය දිනයකදීද?

IV. බුදුන් වහන්සේ පිහිට වූ අසරණයන් 03 ක් නම් කරන්න.

V. තුන් බෑ ජටිලයන් නම් කරන්න.

VI. බුදුගුණ අතුරින් 03 නම් කරන්න.

VII. සිරිත් විරිත් යනු කුමක්ද?

VIII. ආදර්ශමත් සිසුවෙකු ලෙස පාසලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් හතරක් ලියන්න.

IX. භාවනාවෙන් පාසල් දරුවෙකුට ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න.

X. ජේතවනාරාමය පූජා කලේ කවුරුන්ද? ( ලකුණු 10 x 2 = 20 )

(02) I ධම්ද පදය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. ( ලකුණු 2 )

II "අක්කොච්ජිමං ..." යන ගාථාව සම්පූර්ණ කොට තේරුම ලියන්න. ( ලකුණු 3 )

III ඉහත ගාථාවන්ගෙන් සිසු ජීවිතයට ඇති පිටිවහල කෙබදුදැයි කෙටි විස්තරයක් කරන්න.

( ලකුණු 5 )

(03) I ධන පරිහරිහරණයේ දී සමජීවිකතා යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ( ලකුණු 2 )

II උදුම්බර ඛාදිකයින් යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්ද? ( ලකුණු 3 )

III එකේන භෝගේ... යන ගාථාව සම්පූර්ණ කරන්න. ( ලකුණු 5 )

(04) I මහින්දාගමනයේ දී මිහිඳු හිමියන් සමඟ ලක්දිවට වැඩම කළ පිරිස නම් කරන්න. ( ලකුණු 2 )

II මහින්දාගමනයෙන් පසු මෙරට ඇදහිලි හා විශ්වාසයන්ට ලැබුණු නව අදහස් මොනවාද ? ( ලකුණු 3 )

III මහින්දාගමනයෙන් ලත් දායාද 5 ක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(05) I බුදු සිරිතෙන් ඉවසීම ප්‍රකට වන අවස්ථාවක් දක්වන්න. ( ලකුණු 2 )

II ඉවසීමෙන් ලැබෙන ආනිසංස 04 ක් ලියන්න. ( ලකුණු 3 )

III පුණ්ණ හිමියන් පිළිබඳ විස්තරයක් ලියන්න. ( ලකුණු 5 )

(06) I අනේකංගදස්සී වීම යනු කුමක්ද? ( ලකුණු 2 )

II නියාම ධර්ම 05 නම් කරන්න. ( ලකුණු 3 )

III නියාම ධර්ම 02 ක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(07) I සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේසං ජීවිතං පියං ... යන ගාථාව සම්පූර්ණ කරන්න. ( ලකුණු 2 )

II එම ගාථාවේ අර්ථය ලියන්න. ( ලකුණු 3 )

III අධිපති ධර්ම නම්කර කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )